## ශ්‍රී ලංකා
## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## පාර්ලිමේන්තුව

---

# 1998 අංක 13 දරන හේරත් පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 අප්‍රේල් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 5.75 යි.** **තැපැල් ගාස්තුව : රු. 2.50 යි.**

**1998 අංක 13 දරන හේරත් පදනම (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 06 වන දින]

එල් ඩී.- ඕ. 79/95.

**හේරත් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"හේරත් පදනම" නමින් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන ආයතනයක්, ඒ ආයතනයේ සාමාජිකයන් විසින් එකඟ වී ඇති රීති අනුව ඒ ආයතනයට සම්බන්ධ සියලුම පරමාර්ථ හා කරුණු ඵලදායිව ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා පිහිටුවා තිබූ හෙයින්ද : පූර්විකාව.

ඒ ආයතනය පිහිටුවීමට මුල් වූ හේරත් පවුලේ සාමාජිකයන් විසින් අදහස් කරගෙන තිබූ පරමාර්ථ හා කාරණා එකී පදනම මගින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීමට ඉඩදීම මහජන ශුභ සිද්ධිය හා යහපත සඳහා වැදගත් පියවරක් වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 13 දරන හේරත් පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම, ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" නමින් හඳුන්වනු ලබන) හේරත් පදනම තත්කාලීන සාමාජිකයන් හා මින් මතු මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට ඇතුළත් කරගනු ලබන තැනැත්තන් ද, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "හේරත් පදනම" යන නාමය හා අභිධානය යටතේ අඛණ්ඩ පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තවද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණයන් හි නඩු පැවරීම කළ හැකි වන අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය සංස්ථාව සතු වන්නේ ය. හේරත් පදනම සංස්ථාගත කිරීම.

3. මෙම සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :- සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු වර්ධනය කිරීම :

(ආ) ශිෂ්‍ය පරපුරේ පොදු සුභ සාධනය ඇති කිරීම :

2—D 044930—5,900 (97/05)

(ඇ) ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල අධ්‍යාපනය ලබන දක්ෂ සිසුනට ඔවුන්ගේ වැඩිදුර අධ්‍යාපන කටයුතු කරගෙන යාමට දිරිගැන්වීම සඳහා සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම :

(ඈ) අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන ආයතන, තාක්ෂණික හා පර්යේෂණ ආයතන පිහිටුවා පවත්වාගෙන යාමෙන් සහ ඒ සඳහා අවශ්‍ය ව්‍යාපෘති ඇතිකර පවත්වාගෙන යාමෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ දේශීය හා ජාත්‍යන්තර මට්ටමේ සම්බන්ධීකරණය ඇති කිරීම :

(ඉ) උචිත යැයි සංස්ථාව විසින් අදහස් කරන ආකාරයකට ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා මුල්‍යමය, ද්‍රව්‍යමය හා වෙනත් පහසුකම් සපයා දීම :

(ඊ) නායකත්වය හුරු කිරීම පදනම් කරගෙන ජාතික ක්‍රීඩා ආදී ක්‍රියාකාරකම් සංවිධානය කිරීම :

(උ) ජාතික සංවර්ධනය හා සුභ සාධන කටයුතුවල යෙදීම සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සහ වෙනත් යම් ස්ථානයක දී සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යාපන සහ දේශන පැවැත්වීම ද සංස්ථාව විසින් යෝග්‍ය යයි සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම, බෙදා හැරීම සහ ඒ සම්බන්ධ වූ ව්‍යාපෘති ඇති කර පවත්වාගෙන යාම සහ සමාජ සේවා සහ සමාජ සුභ සාධන ව්‍යාපෘති ඇති කර පවත්වාගෙන යාම : සහ

(ඌ) ඉහත සඳහන් පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ මුදුන්පත් කර ගැනීම සඳහා ආනුෂංගික වන්නා වූ හා ඉවහල් වන්නා වූ ද, අවශ්‍ය යැයි හැඟෙන සියලුම ක්‍රියා සහ දේවල් ඉටු කිරීම.

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය.

4. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව මහා සභාව විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් පස් දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වූ (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සංස්ථාවේ රීතිවලට අනුකූලව පවරනු ලැබිය යුතු ය.

(2) සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, ලේකම් සහ භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට අනුව තෝරා පත් කර ගනු ලබන හෝ පත් කර ගනු ලබන වෙනත් සාමාජිකයන් සිවු දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වූ විධායක කාරක සභාවක් වෙත මණ්ඩලයේ කාර්ය කිසිවක් මණ්ඩලය විසින් පවරනු ලැබිය හැකි අතර, ඒ කාරක සභාව විසින් එකී කාර්ය මණ්ඩලයේ විධාන පරිදි ඉටු කළ යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය, මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන මෙහි උපලේඛනයේ නම් සඳහන් ඇත්තා වූ සාමාජිකයන්ගෙන් සමන්විත පදනමේ පාලක සභාව විය යුතු ය.

මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්.

5. (1) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව සංස්ථාවේ නාමයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික හෝ සියලුම ක්‍රියා සහ දේවල් කිරීමට බලය මණ්ඩලයට ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරා දී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව මණ්ඩලය විසින් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම කරනු ලැබිය හැකිය :-

(අ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ රික්ථවරණය කිරීමක් මගින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්පත් කර ගැනීම සහ දැ...ම :

(ආ) එවැනි යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බදු දීම, ප්‍රදානය කිරීම, පවරා දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීම ;

(ඇ) සංස්ථාවට අයත් මුදල්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සුරැකුම්පත්වල ආයෝජනය කිරීම ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යෑම, වැසීම සහ මණ්ඩලයේ දේපළ ඇපයට තබා හෝ නොතබා මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම :

(ඉ) දේශීය හෝ විදේශීය වශයෙන් අරමුදල් එකතු කිරීම සහ ලබා ගැනීම සහ මුදලින් නැතහොත් ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග පිළිගැනීම ; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් හා සේවකයන් සේවයේ නියුක්ත කිරීම.

(3) කවර ප්‍රභවයකින් අත්පත් වුවද සංස්ථාවේ මුදල් හා දේපළ හුදෙක් සංස්ථාවේ මෙහි සඳහන් කර ඇති පරමාර්ථ ප්‍රවර්ධනය පිණිසම යොදා ගත යුතු අතර, ඉන් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ණය, ප්‍රසාද මුදල්, ලාභ හෝ වෙනත් කවර හෝ අයුරකින් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය :

එසේ වුවද, මේ වගන්තියේ විධිවිධාන, පහත දැක්වෙන දෑ, එනම්–

(i) සංස්ථාවේ යම් නිලධරයකු හෝ සේවකයකු හෝ සංස්ථාවේ යම් සාමාජිකයකු සංස්ථාවට කරන ලද යම් සේවයක් උදෙසා සද්භාවයෙන් යම් සාධාරණ හා නිසි පාරිශ්‍රමිකයක් ඔහුට ගෙවීම :

(ii) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු සමාගමක කොටස්කරුවකු වන අවස්ථාවක ඒ සමාගම විසින් සංස්ථාවට කුලියට දෙන ලද ස්ථානයක් සඳහා සාධාරණ සහ නිසි කුලියක් ගෙවීම ; සහ

(iii) තම කටයුතු හෝ කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමේ ලා සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් මණ්ඩලයෙන් කලින් ලබා ගන්නා ලද අනුමැතිය ඇතිව දරන ලද යුක්ති සහගත සහ නිසි වියදම් ආපසු ගෙවීම සහ පියවීම

කෙරෙහි අදාළ නොවිය යුතු ය.

ගෙවිය යුතු සහ ලැබිය යුතු ණය.

6. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනම භාරයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කරනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ දායක මුදල් හා අනෙකුත් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

7. සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය භාරයේ තිබිය යුතු අතර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එය වෙනස් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ අනුමැතිය ඇතිව මණ්ඩලයේ

සාමාජිකයින් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එම සාමාජිකයන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තෙක් විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

8. (1) සංස්ථාව විසින් කලින් කල සංස්ථාවේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :- සංස්ථාවේ රීති.

(අ) ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සහ වෙනත් මූල්‍ය ආධාර දීම ;

(ආ) මණ්ඩලයේ සහ විධායක කාරක සභාවේ රැස්වීම්වල දී අනුගමනය කරනු ලබන කාර්ය පටිපාටීන් :

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන්ගේ සහ සංස්ථාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ බලතල, හැසිරීම, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා විධායක මණ්ඩලයේ අනුමැතිය ඇතිව දරනු ලැබූ වියදම් පියවීම :

(ඉ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, එහි අරමුදල්වල භාරකාරත්වය සහ ගිණුම් පවත්වා ගෙන යෑම සහ ඒවා විගණනය කිරීම ; සහ

(උ) ගිණුම් තැබීම, මුදල් තැන්පත් කිරීම, ලේඛනවල භාරකාරත්වය.

(2) එම රීති සාදනු ලැබීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, අලුතින් යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ තත්කාලයේ සංස්ථාවේ බල පවත්නා රීතිවලට යටත් විය යුත්තා හ.

9. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් මගින් හෝ ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක වෙනත් කිසිම තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ශ්‍රී ලංකා ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

උපලේඛනය (4 (3) වන වගන්තිය)

1. පාඨශාලාචාරිනී යාපා හේරත් මහත්මිය
2. සාම විනිසුරු කිරි බණ්ඩා හේරත් මහතා
3. ආචාර්ය අජන්ත හේරත් මහතා (අධ්‍යක්ෂ ජනරාල්)
4. මහාචාර්ය ජයන්ත හේරත් මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්)
5. මහාචාර්ය සුසන්ත හේරත් මහතා (සභාපති)
6. ප්‍රසන්තා හේරත් මෙනෙවිය
7. නීතිඥ සුවිනීතා හේරත් මහත්මිය

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.